# අයිවන්ගේ අනුන් ලවා මාළු බෑවීම

උවිඳු කුරුකුලසූරිය uvinduk@gmail.com

පසුගිය සතියේ රාවය කතුවරයා තවත් පිළිතුරක් දී තිබුණි. 'අනුන් ගැන මිස තමන් ගැන විවේචනයක් නැති ජනමාධ්‍ය හා ජනමාධ්‍ය බෝම්බ' එයට තිබූ මාතෘකාවය. ගාම්භීර මාතෘකාවකි. පළමු වැකියෙන්ම පැමිණිල්ලකි. 'උවිඳු මාගේ ලිපියට පිළිතුරක් දී තිබුණද මාගේ ලිපියෙන් වාර්තාකරණයට අදාළව මතුකර තිබූ මූලික ප්‍රශ්නයට පිළිතුරක් දී තිබුණේ නැත. පිළිතුරක් දීමට ඔහු ප්‍රශ්නයක් අසා තිබුණේද නැත. පළමු ලිපියෙන් ඔහු කියා තිබුණේ, ඔහු තාවකාලිකව මාළු බෑම නතරකර මාළු අසු නොවන්නේ ඇයිද යන මූලික ප්‍රශ්නයට පිළිතුරක් සොයමින් සිටින බවය. එහි මූලික අතුරු ප්‍රශ්නය වන දේශපාලන ක්‍රමය වෙනස් කිරීම නමින් නම් කර, දේශපාලන ක්‍රමය වෙනස් කළ හැකි බවත් එය කළහැක්කේ කෙසේද යන්න පිළිබඳව ඔහු සොයාගෙන තිබෙන පිළිතුර ඉක්මනින් හා විස්තරාත්මකව ප්‍රකාශ කරන බවත්ය.

ඉදින් සොයාගෙනවත් නැති දෙයකට සහ සොයමින් ඉන්නා දෙයක් ගැන පිළිතුරුදීමක් තබා සාකච්ඡාවක්වත් කළ හැක්කේ කෙසේද? ඉදින්, මට කළ හැකි වූයේ වසර හයක් තිස්සේ ඔහු සොයනවායැයි කියන පිළිතුර ගිය සතියේවත් සොයාගැනීමට හැකි වේවා යැයි ප්‍රාර්ථනාවක් කිරීම පමණි. එය මම ලිපිය අවසානයේ කළෙමි.

දැන් ඔහු දෙවන වතාවටත් පිළිතුරක් දී ඇත. මොනවා කීවත් මෙය සිත කම්පා කරවන දැකුමෙකි. එහෙත් ට්‍රොට්ස්කි විසින් උපුටා කීමට එතරම්ම ප්‍රියත්වයක් නොදැක්වූ ස්පිනෝසාගේ වචන මගේ මතකයට ආවේය. 'වැළපෙන්නටවත් කොක් හඬ ලන්නටවත් නොව තේරුම් ගැනීමටය'.

## පාලකයාගේ ඉතිහාසය

'රුවන් වැලි සෑය නිදර්ශනයකට ගනිමින් අරගලයේ අයිතිය පිළිබඳව උවිඳු කර තිබුණු කරුණු දැක්වීම ලද බොළඳ බව කිව යුතුය.' යනුවෙන් වික්ටර් කියයි. දුටුගැමුණුගේ රුවන්වැලි සෑය සෑදීම පිළිබඳ නිදර්ශනයෙන් මා පෙන්නුම් කිරීමට උත්සාහ ගනු ලැබුවේ ලියා ඇත්තේ 'පාලකයාගේ ඉතිහාසය' බවය. සිංහයා ඉතිහාසය ලියුවොත් දඩයම හොඳම ක්‍රියාව ලෙස සඳහන් කරනු ඇත.' යන දකුණු අප්‍රිකානු කියමනේ තේරුමත් එයමය. එනම් පාලකයාගේ ඉතිහාසයයි. පාලකයාට කැමති ඉතිහාසයයි. වික්ටර් කරමින් සිටින්නේ 'රාවයේ පාලකයාගේ ඉතිහාසය' ලිවීමය. මුල් ලිපියේ 'මම','මම' කියා ලියා තිබුණ දෑ මගේ පෙන්වාදීමෙන් පසු වික්ටර් විසින් යම් සංශෝධනයක් කර ඇත. 'උවිඳු ද ආධාරකරුවෙකු ලෙස ක්‍රියා කළේය. තමා දෙන ලද දායකත්වය ගැන උවිඳු ලියා තිබෙන සියල්ල නිවැරදි නැත. සමහරක් මුළුමනින්ම වැරදි වන අතර තවත් සමහරක් සත්‍ය ලෙසද තවත් සමහරක් අර්ධ සත්‍ය ලෙසද සැලකිය හැකිය.' යනුවෙන් වික්ටර් කියයි. 'එහෙත් ඒ ගැන කතා කිරීම අවශ්‍ය නැත' යනුවෙන් ඔහු තවදුරටත් කියයි. අනේ කතාකරන්න! නිරවද්‍යතාව පිළිබඳ අනාගත ඉතිහාසඥයා පිහිටපතන දළ කෙටුම්පත ජනමාධ්‍යයයි. මේ සාකච්ඡාවේ එක් වැදගත් කරුණක් එයයි.

## අනුන් ලවා මාළු බෑවීම

'උවිඳු කියන්නේ සන්ඩේ ලීඩර් පුවත්පතේ පළවූ ලිපිය එම පුවත්පතට ලියන ලද ලිපියක් නොව ලසන්තගේ දෙවන බිරිඳ සොනාලි සමග පවත්වාගෙන යන වෙබ් අඩවියේ පළවූ ලිපියක් එම පුවත්පත විසින් පළ කර තිබෙන බවය. පිටුවහලේ සිට ලියන ලිපියක් බව සඳහන් කළ යුතුව තිබුණේ එම පුවත්පත බවය. එහිදී උවිඳු භාගෙට හරිය. තවත් භාගයකට වැරදිය. මර්දනීය පරිසරයක් ඇති රටක ඉඳිමින් ලිවීම හා ආරක්ෂාව ලබාගත් විදේශ රටක සිට ලිවීම කොහෙත්ම එක සමානවන්නේ නැත. එවැන්නකු පළමුවෙන්ම අන් සියලුදේට පෙර තමන්ට විදේශ ගතවන්නට වූයේ ඇයිද යන්න පාඨකයන්ට පැහැදිලි කළ යුතුය. උවිඳු සේම ලංකාවේ බොහෝ ජනමාධ්‍යවේදීන්ට ආවේණික ලොකු දුර්වලතාවක් වනුයේ තමන්ගෙන් පරිබාහිර ලෝකයේ තිබෙන කිල්ලෝටවල ඇති හුණු ගැන කතා කරන නමුත් තමන්ගේ කිල්ලෝටවල ඇති හුණු ගැන කතා නොකිරීමය.' යනුවෙන් වික්ටර් කියයි.

මොකක්ද භාගෙකට වැරදි? අපගේ වෙබ් අඩවියේ එය පිටුවහලේ සිට පවත්වාගෙන යන්නක් බවත් ලංකාවේ පරිසරයත් ගැන පැහැදිලිව සඳහන්ව තිබේ. උත්තරය සරලය. වික්ටර්ගේ ලිපි දෙක තුළම එය අඩංගුව තිබේ. යුද්ධයක් අවසන් වී වසර දෙකකටත් පසුවත් 'රටේ ඇත්තේ මර්දනකාරී පරිසරයක්' බව වික්ටර් කියයි. ඔය තියෙන්නේ උත්තරේ!

'මොකක්ද මේ භාගෙට වැරදි? ඔය තියෙන්නෙ උත්තරේ' මම දුරකතනයෙන් අමතා වික්ටර්ට කීවෙමි. වික්ටර් දුන් පිළිතුරෙන් මට හැඟී ගියේ ඔහු මා ලව්වා මාළු බාවන්නට උත්සාහ කරන බවකි. මාද ඇතුළුව ජනමාධ්‍යවේදීන් පිටුවහල් කිරීමේ කුමන්ත්‍රණය හා ජනමාධ්‍ය සංගම් දූෂණ අතර සම්බන්ධය පිළිබඳව මට මතයක් තිබේ. ලංකාවෙන් පිටමං වන්නට මොහොතකට කලින්ද පසුවද වික්ටර්ට මම ඒ ගැන කියා ඇත්තෙමි. මේ ප්‍රශ්නය පිළිබඳව සඟවන්නට දෙයක් නැත. වික්ටර් ලවා මෙන්ම තවත් බොහෝ ජනමාධ්‍යවේදීන් ලවා මේ ප්‍රශ්නය පිළිබඳ මම මාළු බාවා ඇත්තෙමි. එහෙත් වික්ටර් මෙන්ම අනෙක් අයද මාළු බාන්නේ බාගෙටය. මාළු අහුවන්නේ නැත. ජනමාධ්‍යවේදීන්ගේ ප්‍රශ්න ගැන මාළු බාන්නට වික්ටර් කැමතිය. එහෙත් ආණ්ඩුවේ දූෂණ භීෂණ ගැන මාළු බාන්නට වික්ටර් අකමැතිය. කොහොමද වැඩේ! මම නම් දෙකම ගැන මාළු බාන්නට කැමතිය. වෙනස ඇත්තේ එතැනය. ස්වාධීනත්වය, අපක්ෂපාතීත්වය යන සංකල්පයන්හි තවත් තේරුමක් එහි ඇත. වික්ටර් ගේ ඉල්ලීම පිට මම ඒ ප්‍රශ්නය පිළිබඳව මාළු බාන්නෙමි. නමුත් ඊට පෙර නිවැරදි කළ යුතු යම් යම් දේ තිබේ.

## දුරකතන සංවාද සහ සංස්කරණ නිදහස

වික්ටර් මා සමඟ කළ දුරකතන සාකච්ඡා ගැන සඳහන් කරයි. පෞද්ගලික සාකච්ඡා අවසර නොමැතිව ලිව හැක්කේ අතිවිශාල මහජන යහපතක් ඇත්නම් පමණි. මා කී දේ වික්ටර් ලිවීම පිළිබඳව මට අමනාපයක් නැත. එහෙත් කී දේ හරියටවත් ලිවිය යුතුව තිබුණි. 'ඔහු සිය ලිපියේ අධිකරණ ස්වාධීනත්වය වෙනුවෙන් පෙනී සිටි පුවත්පත් කතුවරුන් තිදෙනෙකුගේ නම් සඳහන් කර තිබුණි. එහෙත් විස්තර කර තිබුණේ මා ගැන පමණය. වර්තමානයේ සිදුවන දේ පිළිබඳව දොස් පවරා තිබුණේද මට පමණය. අනෙක් කතුවරුන් දෙදෙනා කළ මෙහෙයන්ද කෙටියෙන් වුවත් සඳහන් කළ යුතුව තිබුණේදැයි මම ඔහුගෙන් ඇසුවෙමි. ඔහු ගත් කටටම කීවේ ඔවුන් කළ දෙයක් නැති බවත් ඔවුන් සතුටු කිරීම පිණිස එසේ කළ බවත්ය.' යනුවෙන් වික්ටර් කියයි. මේ නම් ඔහුගේ හිතේ පහළවූ අදහසකි. මේ සංවාදය කියවන්නෙකුට වික්ටර් එවැනි ප්‍රශ්නයක් එනම් අනෙක් දෙදෙනා කළ මෙහෙයද සඳහන් කළ යුතුව තිබුණේදැයි? අසාවි යැයි සිතිය හැකිද? ඇතිවූ සාකච්ඡාව මෙපරිදිය.

ඔයා මේ අනෙක් කර්තෘලා ගැන කියල තියෙනවා. මොනවාද ඒ ගොල්ල...? යනුවෙන් වික්ටර් කියන විටම ඔහුගේ වාක්‍යය අවසන් කිරීමට පෙර මා කීවේ සුළුවෙන් වුණත් යමක් කර තිබෙන බවය. මේ ප්‍රශ්නය මතුවී තිබෙන බැවිනුත් එය සමස්ත සාකච්ඡාවටද අදාළ බැවිනුත් අනෙක් කතුවරුන් ගැනද යමක් කිවයුතුය. ලසන්ත වික්‍රමතුංගගේ සන්ඩේ ලීඩර් පුවත් පතත් වික්ටර් අයිවන්ගේ රාවය පුවත්පතත් ජවිපෙට අයත් ලංකා පුවත්පතත් හැරුණුවිට ලංකාවේ අනෙක් පුවත්පත් ධනපති පංතියේ දේශපාලන ව්‍යාපාරික හා පවුල් වුවමනා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන පුවත්පත්ය. ඒවායේ සේවය කරන අයට යුරෝපා රටවල කවුරු හෝ ජනමාධ්‍යවේදීන් භුක්තිවිඳින සංස්කරණ ස්වාධීනත්වයක් නැත. ලංකාවේ බොහෝ ජනමාධ්‍යවල ජනමාධ්‍යවේදීන් සිය සංස්කරණ ස්වාධීනත්වය වෙනුවෙන් සටන් වදින්නේ නැත. ජනමාධ්‍ය වෘත්තීය සමිතියක් පිහිටුවා ගන්නටවත් පාලකයන් ඉඩ දෙන්නේ නැත. ජනමාධ්‍ය වෘත්තීය සමිති ඇත්තේ රාජ්‍ය අංශයේ ජනමාධ්‍ය ආයතන තුළ පමණි. ඒ වෘත්තීය සමිතිවත් සංස්කරණ ස්වාධීනත්වය කෙරෙහි සටන් කරන්නේ නැත. මේ සියලු සීමා සහිතකම් මධ්‍යයේ වුවද ලංකාවේ අනෙක් කතුවරුන්ට වුවමනාවක් තිබුණද වික්ටර් අයිවන් අත්හදා බලා ප්‍රතිඵලයක් ලැබී නැතැයි කියන නඩු කීමේ මාර්ගවලට පිවිසෙන්නට හැකියාවක් නැත. රාවයේ අයිතිකරුවාද ප්‍රධාන කතුවරයාද වික්ටර් අයිවන් ය. එය උකසට තබා නඩුහබවල පැටලෙන්නට වික්ටර්ට හැකියාවක් තිබුණද අනෙක් අයට එසේ කරන්නට බැරිය. සන්ඩේ ටයිම්ස් පුවත්පතේ රාජ්පාල් අබේනායක අගවිනිසුරුවරයාට විරුද්ධව නඩුපැවරුවේ සන්ඩේ ටයිම්ස් ආයතනයේ මුදලින් නොවේ. නීතිඥවරයෙකුද වන ඔහු තම නඩුව වෙනුවෙන් තමාම පෙනී සිටියේය.

## චැනල් ෆෝවට තඩිබෑම

ජනමාධ්‍යයේ කුණුවීම ගැන සහ එයට ඇති බලය ගැන අයිවන් කියන දේ ගැන මට වාදයක් නැත. එහෙත් මේ චැනල් ෆෝ එකට තඩිබෑම නම් අනුමත කළ නොහැක. වික්ටර්ට චැනල් ෆෝ නිර්මාණය ගැන ලංකාවෙන් පලා ගිය ජනමාධ්‍යවේදීන් ලබා දී තිබෙන දායකත්වය ගැන මා සමඟ කතා කිරීමේ අවශ්‍යතාවක් තිබුණු බව කියයි. ඒ ගැන මා දන්නා දෙයක් නැත. 'ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජනමාධ්‍යවේදියෝ' නම් සංවිධානයට මාගේ කිසිම සම්බන්ධයක් නැත. එහි හොඳ කිහිපදෙනෙකු මෙන්ම තක්කඩි කිහිපදෙනෙකුද සිටින සංවිධානයකි. එහෙත් එම චිත්‍රපටයට අදාළ එක වීඩියෝවක් චැනල් ෆෝ වෙත ලබා දී තිබුණේ ඒ සංවිධානයේ ඉන්නා 'හොඳ' අය විසිනි. ඔවුන්ට මාගේ උණුසුම් ආචාරය!. ඔවුන් එය ලබාදීමෙන් කර ඇත්තේ ඉතාම විශිෂ්ට ක්‍රියාවකි.

නමුත් මේ චිත්‍රපටයේ ඇති සිංහල දෙබස් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම සඳහා මාගේ නම යෝජනාවී තිබුණද චැනල් ෆෝ සහ තවත් අය කියා ඇත්තේ මට ඇති ආණ්ඩු විරෝධී හංවඩුව නිසා නම් එළිදරව් කිරීමට සිදුවුවහොත් අපක්ෂපාතීත්වය පිළිබඳ ප්‍රශ්නයක් මතුවිය හැකි බවයි. මා වසන්ත රාජාගේ නම යෝජනා කළ විට එයද ඉවත දමා ඇත්තේ කොටියෙකු නොවුණද ඔහුට ගසා ඇති කොටි හංවඩුව නිසාය.

ඇත්ත වශයෙන්ම චිත්‍රපටයේ අඩංගු මොනවාදැයි දැන සිටියේ නම් චැනල් ෆෝ ආයතනයට උදව් කරන්නට තිබුණි. එම චිත්‍රපටය එල්ටීටීඊය ළමා සොල්දාදුවන් යොදාගත් බව කියමින් පක්ෂග්‍රාහීව කටයුතු කර ඇත. ආණ්ඩුවේ අනුග්‍රහය ඇතිව ආණ්ඩුවේ ඇමතිවරයෙකු වන කරුණා විසින් නඩත්තු කරන ලද ළමා සොල්දාදුවන් සහ අංකතහඩු නොමැති සුදුවෑන් රථයක ඡායාරූපද මා සතුව ඇත. තවමත් කොහේවත් නොපළවූ ඒ ඡායාරූප ගන්නා ලද්දේ මා විසිනි. ඒවාත් ඇතුළත් කළේ නම් පක්ෂග්‍රාහී යැයි යන චෝදනාවෙන් යම් තරමකට හෝ මිදෙන්නට ඔවුන්ට හැකිව තිබුණි.

චැනල් ෆෝවට තඩිබාන වික්ටර් සති කිහිපයකට පෙර එනමින්ම එනම් 'කිලිං ෆීල්ඩ්' නමින් 88-89 භීෂණ ගැන බීබීසිය කළ වාර්තාමය වැඩසටහනකට ප්‍රශංසා කර ඇත. එහෙත් ඒ වාර්තා වැඩසටහනේ ඇතුල් පැත්ත වික්ටර් නොදන්නවාද? තමාට කැරලිකරුවන් සමඟ සම්බන්ධයක් ඇතැයි කියමින් බීබීසීය තිස්සමහාරාමයට ගෙන්වා ඔවුන්ට සියලු විස්තර සපයා තමාගේ වාහනයද එම ගමන් යෑම සඳහා ඔවුන්ට ලබාදී එම වැඩසටහනට අවශ්‍ය සියලු උපකාර කරන ලද්දේ මහින්ද රාජපක්ෂ නොවේද?

## වික්ටර් පොහොසත් වීම

වික්ටර් තමාට ආර්ථික ප්‍රශ්න නැතැයි කියයි. එය නම් සතුටට කරුණකි. අනූවේ දශකයේ මුල්භාගයේ රාවයට ලියූ ලිපියක ඔහු ලියා තිබුණේ ඔහුගේ බැංකු ගිණුමේ ඇත්තේ රුපියල් තුන්සිය ගණනක් බවය. වසර පහළොවකට පසුව ආර්ථික ප්‍රශ්න නැතැයි කීම අසා සහෘදයෙකු ලෙස මම සතුටට පත්වෙමි. එහෙත් අසතුටට පත්වන කාරණය නම් වික්ටර්ගේ එම සඳහන මගින් අනියමින් මා මේවා ලියන්නේ මුදලට බව හැඟවීමයි. ලංකාවේදී නම් මටත් කිසිම ආර්ථික ප්‍රශ්නයක් නොතිබුණද පිටුවහලේ සිටින බැවින් අගහිඟකම් බොහෝය. එහෙත් මේ ලියන කිසිම ලිපියකින් මුදල් ලැබෙන්නේද නැත, දෙන්නේද නැත, ඉල්ලන්නේද නැත. මේ වෙබ් අඩවිය ලිවීමෙන් කිසිම මුදලක් ලැබෙන්නේද නැත. කොටි හංවඩු ගසා තිබුණද දෙමළ ඩයස්පෝරාවවත් කීයවත් දෙන්නේද නැත. යුරෝපා රටවලට පැමිණි සමහර දෙමළ ජනමාධ්‍යවේදීන් තම වෘත්තිය අතහැර දෙමළ ඩයස් පෝරාවේම සිල්ලර කඩවල දෙකයි පනහට තුනයි පනහට බඩු කර ගසන්නේ 'දෙමළ විමුක්ති අරගලය' ගැන කුණුහරුපයෙන් බැණවදිමිනි.

## පිටුවහලේ සිට චණ්ඩිකම්

'මේ අරගලයේදී මටද මෙම අරගලය හේතුවක් කරගනිමින් ලංකාවෙන් පලා ගොස් කිසියම් රටක දේශපාලන ආරක්ෂාව ලබාගනිමින් පිටුවහලේ සිට උස් ස්වරයකින් කතා කිරීමේ හැකියාව තිබුණි. එහෙත් මම එම මග තෝරා නොගත්තෙමි' යනුවෙන් වික්ටර් අයිවන් කියයි.

දැන් මේ ටිකත් කියවන්න. 'ටික දිනකට හෝ රටින් පිටව සිටීම සුදුසු බව මම ලසන්තට යෝජනා කළෙමි. ඔහුද ඊට එකඟවිය. එදිනට කොළඹදී හමුවීමට තීරණය කර ගතිමු. මම ඇඳුම් බෑගයද රැගෙන කොළඹ ආවෙමි. ලසන්තද ආවේ ඇඳුම් බෑගය රැගෙනය. වීසා අවශ්‍ය නොවන නිසා සිංගප්පූරු යෑම අපේ අභිලාෂය විය. ගමන සැලසුම් කරමින් සිටියදී රනිල් වික්‍රමසිංහගෙන් ලැබුණු හදිසි දුරකතන ඇමතුමක් නිසා ලසන්ත රනිල් බලන්නට ගියේය. ඔහු ආපසු ආවේ රටින් පිටවීමේ අදහස අතහැර ගෙනය.... අවසානයේ මමද සිංගප්පූරු යෑමේ අදහස අත හැරියෙමි.' (පිටුව 402 පෑන අභිංසකද? -වික්ටර් අයිවන්)

ඉතිං මොනවද මේ කියන්නේ. මා මෙන්ම තවත් කිහිප දෙනෙකුම පිටමං වූයේ තාවකාලිකවය. රනිල් වික්‍රමසිංහටවත්, වික්ටර් අයිවන්ටවත් ආණ්ඩුවේ හිතවත් ඇමතිවරුන්ටවත් අපගේ ජීවිතාරක්ෂාව ගැන සහතිකයක් දීමට නොහැකි විය. මම මීට පෙරද තාවකාලිකව එංගලන්තයේ සිට තත්ත්වය වෙනස් වූ වහාම ලංකාවට පැමිණියෙක්මි. නමුත් වික්ටර් අයිවන් කියන පරිදි ලංකාවේ ඇත්තේ මර්දනයකි. ඉදින් රාවයේ අනෙක් අයත් සමඟ මාළු බාන්නට එන්න. හැමෝම එකා සේ මාළු බාන්නේ නම් මාළු අසුනොවුණද අඩුතරමින් මාළුවන් බය කර ගැනීමට හැකි වනු ඇත. එතකොට අපටද ලංකාවට පැමිණීමට හැකිවනු ඇත. වික්ටර්ගේ දුරකතන සංවාදයේ තවත් නිවැරදි කිරීමක් කළ යුතුව ඇත. පිටුවහලේ යුරෝපයේ සිටින ජනමාධ්‍යවේදීන් ගෙන් අඩක් පමණ අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් පළා ගියවුන් බව මා කියූ බව වික්ටර් ලියා ඇත. මා කීවේ අඩක් නොව සියයට අසූපහක් (85%) ක්ම බොරුකාරයන් බවය. සුනන්ද දේශප්‍රියට අනුව 70ක් ජනමාධ්‍යවේදීන් පිටුවහලේ සිටී. මා කියන්නේ ඒ 70න් 85% ක් බොරුකාරයන් බවය. ■



# මේක නැගිටීමේ අයිතියවත් නැති රටක්

**නීතිඥ එල්මෝ පෙරේරා**

විමලනාත් වීරරත්න

**දූෂණයට විරුද්ධව ඉන්දියාවේ අන්නා හසාරේ වැනි නායකයෙක් ගෙන යන ආකාරයේ ක්‍රියාවලියක් ලංකාවේ ඇති නොවන්නේ ඇයි?**

අපේ රටේදි කතා කරන්නෙ වංචා කරපු අය ඒවා යටපත් කරගැනීම සඳහායි. වංචාවලින් පාඩු විඳින අය තවම එළියට එන්නෙ නැහැ. ඒ අය එළියට ආ දවසට තමයි අන්නා හසාරේ කරන දේ අපිටත් කළ හැකි වන්නේ. ඉන්දීය ආණ්ඩුව අන්නා හසාරේ ගැන මොනවා කිව්වත් ඔහු මේකත් අවංකව කරන වැඩක් බව පේනවා. ඒ නිසා තමයි මුළු රටම ඔහු පිටුපස ඉන්නෙ. දැන් අපේ රටේදි සරත් නන්ද සිල්වා වගේ කෙනෙක් ඔය වැඩේ කළොත් කවුරුවත් එන එකක් නැහැ. මේ රටේ තියෙන ප්‍රශ්නෙ තමයි මොන විධියෙ හොරකමක් කළත් බලය අල්ලගත්තොත් හොරකම කිසිවෙකුත් ප්‍රශ්න නොකිරීම. ඒක අපේ රටේ තියෙන නරක ලක්ෂණයක්.

**ඇත්තටම වංචා ක්‍රියාවලට ලක්වන අය ඉදිරියට නොඑන්නේ එවැනි විරෝධයක් මෙහෙයවන්න පුද්ගලයෙක් හෝ ව්‍යාපාරයක් නොමැති නිසාද?**

ඒකත් එක හේතුවක් තමයි. ඊළඟට නැතිවුණු එක නැති වෙච්චාවෙ තිබෙන ටික පරිස්සම් කර ගන්නවා කියලා ඔවුන් හිතනවා. මොකද සමහර වෙලාවට සාධාරණත්වය වෙනුවෙන් වැඩකරන්න ගිහින් ඒක තමන්ගෙ පැත්තටම කැරකුණු අවස්ථා තිබෙනවා. ඉතිං වංචා විඳගෙන ඉන්නවා, ඉල්ලගෙන කන්නෙ මොකටද කියලා හිතලා. කාටවත් රටේ සිදුවන වංචා දූෂණ ගැන කැක්කුමක් නැහැ කියලනෙ බැලූ බැල්මට පේන්නෙ. ඇත්තටම මිනිස්සුන්ට එහෙම කැක්කුමක් නැතුවා නෙවෙයි. නමුත් ඒ කැක්කුම ප්‍රායෝගිකත්වයට නැංවෙන්නෙ නැහැ.

**ඉන්දියාවෙ ජනයා එතනදි වෙනස්වුණේ කොහොමද?**

නිදසුනක් ලෙස මම දූෂණ විරෝධී ව්‍යාපාරයක් ගෙනයන්න හිතාගෙන ඉන්නවා කියලා හිතමු. මම වගේ අනන්ත ප්‍රමාණයක් මිනිස්සු තව රටේ ඉන්නවා. ඒ මිනිස්සු මම මෙහෙම ක්‍රියාවකට අවතීර්ණ වෙන්න ඉන්නවා කියන එක දැනගන්නෙ කොහොමද? ඉන්දියාවෙ අන්නා හසාරේගෙ වැඩේ ගැන රූපවාහිනියෙ විකාශය වෙනකොට ඉන්දියාවෙ ජනයා මහා බලවේගයක් ලෙස ඒ කරා එන හැටි අපි රූපවාහිනියෙන් දැක්කා. එහෙම අනුබලයක් මෙරට ජනමාධ්‍යයකින් ලැබෙන්නෙ නැහැ. රජයත් අනිසි විධියට ජනමාධ්‍යයට බාධා කරනවා. අනික් එක ඒ බහුතරයක ඉන්න ජනමාධ්‍යවේදීන්ටත් රටේ සිදුවන දේවල් ගැන කිසිම හැඟීමක් නැහැ. ඉන්දියාවෙ ජනයා දූෂණ ගැන දැනුවත්වෙලා ඉදිරියට එන්න පැහැදිලිවම ජනමාධ්‍ය එරට විශාල කාර්යභාරයක් කරනවා.

**අපේ රටේ දූෂණ සිද්ධවන ප්‍රමාණය පිළිබඳව අපට තිබෙන තක්සේරුව මොකක්ද?**

දූෂණයක් සිදුවෙලාද නැද්ද කියන එක ගැන තීරණයක් ගන්නෙ ඒ ගැන විමර්ශනය කරන ආයතන හෝ පුද්ගලයායි. විමර්ශනය කරන අයගේ මිම්ම අනුව තමයි දූෂණයේ ප්‍රමාණය තීරණය වන්නේ. ඉතින් හුඟක් විමර්ශන නිලධාරීන්ටත් ඔය පගාවක් වගේ දෙයක් දෙන එක දූෂණයක් නෙවෙයි. මම උසාවියෙ වැඩ කරනකොට යම් යම් වැඩ කරන්න ලිපිකරුවන් ඇතුළු පහළ ශ්‍රේණිවල කාටවත් ශත භාගයක්වත් දෙන්නෙ නැහැ. හැබැයි ඔවුන් මගේ වැඩ ප්‍රමාද කරනවා. සන්තෝෂම දෙන නීතිවේදීන්ගේ ෆයිල් ඉක්මනට උඩට අරන් තියනවා. උසාවියෙ වැඩ කරන ඉහළම පෙළේ නීතිවේදීන් හැමෝටම පේන්න එහෙම සල්ලි දීලා පහළ සේවකයන්ගෙන් වැඩ ගන්නවා. දැන් අපි සරත් සිල්වා කරපු දූෂණ විරෝධී දේශනය ගනිමු. ඔහු අද කියන්නෙ තමන් එදා කරපු හැම වැරදි දෙයක්ම හරි දේවල් කියලයි. ඊට පස්සෙ අද සිදුවන වැරදි ගැන විවේචනය කරනවා. අද ප්‍රශ්න ටික කතා කරපු නිසා එදා ඔහු කළ වැරදි සමාජයට විෂය වෙන්නෙ නැහැ. මේක අන්තිම නරක තත්ත්වයක්. සරත් සිල්වා අගවිනිසුරු ධුරය දරන තෙක් අන්තිම බරපතළ වැරදි තීන්දු දුන් කෙනෙක්. නමුත් එහෙම අය තමයි අද දූෂණ විරෝධී දේශන කරන්නෙ. දේශපාලන ව්‍යාපාර ඒවා සංවිධානයත් කරනවා, මිනිස්සු ඒවා අහන්නත් යනවා. මට හරි පුදුමයි මේ තත්ත්වය ගැන.

**ඔප්පු කළ හැකි සාධක නැති නිසා පෙන්නන්නට තිබෙන සමහර වංචා දූෂණත් මෙරට ජනමාධ්‍ය වාර්තා කරන්නේ නැහැ. මේ තත්ත්වය ඔබ තේරුම් ගන්නෙ කොහොමද?**

සරත් සිල්වා දූෂණ විරෝධී දේශනයෙදි කියපු එක ඇත්ත කතාවක් ඕක. අල්ලස් හෝ දූෂණ කොමිසමේ නොයෙල් විජේනායක මහතා කොමසාරිස් ධුරය දරන කාලෙ විමර්ශන කටයුතු සඳහා පෙත්සමක් ඉදිරිපත් වෙන්නට ඕනෙ නැහැ. ඔහු සිය නිලධාරීන් යොදවා තමන්ට ලැබෙන දූෂණ පිළිබඳ තොරතුරු ගැන අදාළ ස්ථානයට ගිහින් විමර්ශන කටයුතු සිදුකරනවා. ඊට පස්සෙ පත්වුණු ඉයන් වික්‍රමනායකත් බොහොම හොඳට ඒ ආකාරයෙන්ම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා වැඩ කළා. ඔහු කෙළින්ම අදාළ තැනට පනිනවා. යකඩයා කියලයි කවුරුත් ඒ කාලෙ කිව්වෙ. 94 දී ජී.එල් පීරිස් තමයි ඔය ක්‍රමය වෙනස් කළේ. ඒ කියන්නෙ විමර්ශන සඳහා පැමිණිලි ලැබිය යුතුයි කියන නීතිය ගෙනාවා. මේකෙ තියන නරක කොන්දේසිය තමයි චෝදනාව ඔප්පු කරන්න බැරිවුණොත් පැමිණිලිකරු වසර 10ක සිරදඬුවමකට යටත් කරනවයි කියන එක. දූෂණ වෙනවයි කියලා පෙනුණත් ඒවා නීතිමය ක්ෂේත්‍රයේදී ඔප්පු කරන්න බැරි වුවොත් පැමිණිලිකරු අමාරුවෙ. ඉතිං මිනිස්සු මේ ක්‍රියාවලියට ඇතුළත් වෙන්න බයයි. මේක ජනමාධ්‍යයටත් අදාළයි. හයිවේ එකක් හදනකොට කිලෝමීටරයකින් මෙච්චර වංචා කළා කියලා ඔබ ලියනවා නම් ඒකට විරුද්ධව චූදිතයා උසාවි ක්‍රියාමාර්ගයකට ගියොත් ඔබ චෝදනාව ඔප්පු කළ යුතු වෙනවා. නමුත් ඔප්පු කළ නොහැකි ලෙස කිසිම සාක්ෂියක් ඉතුරු නොකර වංචාව සිදු කර තිබෙනවා නම් ඇත්තටම වැඩේ සිදුවෙලා තිබුණාට එළිදරව් කරන්න බැහැ. ඕනෙම දෙයක් සූක්ෂමව කළ හැකි ක්‍රම සහ විධි අද තියෙනවා. එතකොට බලය තියන පාර්ශ්වයට වැඩි ආරක්ෂාවක් සහිතව ඕනෑම දෙයක් කළ හැකි තත්ත්වයක් නිර්මාණය වී තිබෙනවා. අන්තිමට අර චෝදනා කරන මනුස්සයා හුදකලා වන පසුබිමක් මේ රටේ අද තියෙන්නෙ. ඉස්සර නම් නිර්නාමිකව අල්ලස් කොමිසමට තොරතුරක් දුන්නත් ඉයන්ලගෙ, නොයෙල්ලගෙ කාලෙ විමර්ශන කටයුතු කෙරුණා. අද නිර්නාමිකව තොරතුර දුන්නට වැඩක් නැහැ., ඒ පුද්ගලයා විධිමත්ව පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු වෙනවා. ඉතිං ඕකත් වෙන වැඩක්ද? ජනමාධ්‍ය නීතිය නම් කවුරුහරි තොරතුරක් කිව්වාම සොයා බලා නිරවද්‍යතාව තහවුරු කරගෙන ලිවීමයි. අල්ලස් කොමිසමට එහෙමවත් නැති එක පාඩුවක්. පැමිණිල්ල කරන්නා අමාරුවෙ දාන කොමිසමක් ඒක. සමහරවිට මෙහෙමත් වෙනවා. පොලිසිය ඇත්ත චූදිතයගෙන් පගාව අරගෙන තමන්ට ලැබුණු පැමිණිල්ලට චූදිතයාගේත් අනුදැනුම ඇතුව ඔහුගේම අනුගාමිකයෙකු ලක් කරනවා. එතකොට කොහොමත් ඇත්ත චූදිතයා හසු වෙන්නෙ නැහැ. පැමිණිල්ල කළ පුද්ගලයා අමාරුවෙ වැටෙනවා. දූෂණ විමර්ශනය කරනවාට වඩා දූෂණවලට අනුබල දෙන තත්ත්වයක් රටේ තියෙන්නෙ. අනික් අතට බොහොමයක් නිලධාරීන්ට උදව්පදව් මාර්ගයෙන් අල්ලස් දීලා ඒ කාගෙත් කටවල් වහලා තියන තත්ත්වයක් තුළ දූෂණ පිටු දකින්නේ කොහොමද?

කෝප් වාර්තාවට මොකද වුණේ. රජයේ ඉහළම කෙනෙක් ඒ විමර්ශන ක්‍රියාවලිය බලය පාවිච්චි කරලා නැවැත්තුවා. ඒ ඉහළ පුද්ගලයාත් වංචාකාරයෙක්. ඒකෙන් කෝප් එක විහිළුවක් වුණා.

**ක්‍රමය තුළම දූෂණ විමර්ශන ආයතන විධිමත්ව පවත්වාගෙන යන්න අවකාශයක් සලසා නැති තත්ත්වයක් ඔබ තේරුම් ගන්නෙ කොහොමද?**

අද කාටවත් ඇත්ත කියන්න බැහැ. ඒ නිසානෙ කිව්වෙ මගේ පැත්තෙ ඉන්න අය රටට ආදරේ කරන අය. මට විරුද්ධ නම් රටේ ද්‍රෝහීන් කියලා. වැරදි දෙයක් සිදුවෙනකොට ඒක කියන්න වෙන්නෙ පාලකයන්ට විරුද්ධවනෙ. එතකොට ඒ පුද්ගලයා ද්‍රෝහියෙන් ලෙස නම් කරනවා නම් වැරදි ස්ථාපිත වෙනවා මිසක් ඒ වැරදි ගැන විමර්ශනයක් කෙරෙන්නෙ කොහොමද? ආණ්ඩුවට ඇඹැට්ටයොත් ඉන්නවනෙ. කේළාම් කීමෙන් යැපෙන හමුදාවක් ඉන්නකොට සාධාරණය පතන මිනිහෙකුට ආයතනයක් තුළ වුවත් වැරැද්දට විරුද්ධ වෙන්න අමාරුයි. මොකද පහුවදා ඒ මිනිහගෙ බෙල්ල යනවා.

**ඉන්දියාවෙ අපි දකින දෙයක් තමයි පක්ෂවලින් තොරව වුවත් පුරවැසියා තමන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම. ඇත්තටම පුරවැසි අයිතිය පිළිබඳ අදහසක් අපිට නැද්ද?**

ඉන්දියාවෙ ජනයා දන්නවා, ඔවුන්ට අයිතියක් තියෙන බව විරුද්ධත්වය පාන්න. අපේ අයත් දන්නවා වුණාට විරුද්ධකම් පාන්න ගියොත් වෙන දේත් දන්නවා. එහෙම බලනකොට නරක දේශපාලන පසුබිමක් අපිට තියෙන්නෙ. අපේ දේශපාලනය සම්පූර්ණයෙන් කුණුවෙච්ච ක්‍රමයක්නෙ. ඉන්දියාවෙ මිනිස්සු නැගිටීම හෝ කරනවා, මෙරට මිනිස්සු නැගිටින්නෙ නැහැ බයට. ඉන්දියාවෙ මිනිස්සුන්ට නැගිටීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය හෝ ලැබී තිබෙනවා. අපිට ඒකත් නැහැ. ඕනෑම කෙනෙක් ජීවිතයට හානියක් වෙනවට බයයිනෙ.

**ආසන්නම කාරණා දෙකක් ලෙස දැන් පෙට්‍රල් සහ සිමෙන්ති ආනයනයේදී වංචාකාරීව එය සිදුවුණු බවක් දක්නට ලැබෙනවා. ඒවා සම්බන්ධයෙන් කැකිල්ලේ තීන්දු ලැබෙන බවක් පෙනෙන්නට තිබෙනවා. මේවා අන්තිමට වගකිවයුත්තෙක් නැති දූෂණ ලෙසයි සමාප්ත වෙමින් තිබෙන්නෙ.**

අද මහ රජාගෙ පැත්තෙ ඉන්න ඕනෑම කෙනෙක් මොනවා කළත් ඒක වැරැද්දක් නෙවෙයි. අනික් පැත්තෙ ඉන්න කෙනෙක් මොනවා කළත් ඒක වරදකට ලසු කළ හැකියි. මේ ක්‍රමයෙන් හුඟක් දුර යන්න බැහැ. දැනට නිහඬව ඉන්න අයටත් නොබෝ දිනකින් එළියට එන්න සිදුවෙනවා. බලය කියන එක හැමදාම තමන්ගෙ අතේ තියෙයි කියලනෙ පාලකයො හිතන්නෙ. තමන්ට ඕන විධියට නීතියත් වෙනස් කරගෙන ඔවුන් වැඩ කරනවා.

**ඒ කියන්නෙ ආණ්ඩු වෙනස් කරන්න පුරවැසි බලයක් අපිට නැහැ කියන තැනටද අපි ඇවිත් ඉන්නෙ.**

ඔව් ඒක තමයි මේ වෙලා තියෙන්නෙ. පාලකයන්ට ඕන එකක් කළ හැකියි. පුරවැසි බලයක් කියල එකක් තියනවා නම් ඕනෑම කෙනෙකුට ඕනෙ දෙයක් කළ හැකි වෙන්න බැහැනෙ. නමුත් මේ කවර බාධක තිබුණත් ඉන්දියාවෙ වගේ ව්‍යාපාරයකට අපි යන්න ඕන. ඒ සඳහා විශේෂයෙන් පුරවැසි බලය පිළිබඳව ජනයා දැනුවත් වෙන්න ඕන.

**අත්තනෝමතිකත්වයට, දූෂණයට, නීතියේ පාලනය මුළුමනින් බිඳවැටීමට ක්‍රියාකළ හිටපු අගවිනිසුරු සරත් එන් සිල්වා වැනි අයෙක් අද වන විට දූෂණ පිටු දැකීමේ ව්‍යාපාරයේ නියමුවෙක් වී සිටිනවා. මේ තත්ත්වය ඔබ දකින්නේ කොහොමද?**

ඔහු කළ දේවල් නියම සිහියෙන් සිටි හැමෝම දන්නවා. ඒවා ගැන පොත් ලියවී තිබෙනවා. ලියවී තිබෙන්නේ බොරු නම් සරත් සිල්වා නඩු දාන්න එපායැ. හරි නම් සරත්ට පාරෙ බැහැල යන්න බැරි තත්ත්වයකුයි උදා වෙන්න ඕන. ඒක මග හැර යන්න තිබුණු හොඳම ක්‍රමය මිනිහා ධුරයෙන් ඉවත් වෙනකොටම බදාගත්තා. ඒක තමයි බුද්ධාගම. නමුත් ඔහු බුද්ධාගම හොඳට පාඩම් කර තිබෙන බව පේනවා. ඔහුගේ දේශනවල දාර්ශනික ගැඹුරකුත් තිබෙනවා. නමුත් දේශකයා ඇතුළෙ ඉන්නෙ දූෂකයෙක්. මිනිහ කතා කරන්නෙ හීනෙකින්වත් පවක් නොකළ කෙනෙක් හැටියට. අපේ රටේ මිනිස්සු දුරදිග බලනවා අඩුයි. ප්‍රශ්නයක යටි පැත්තේ තියෙන්නේ මොකක්ද කියලා බලන්නෙ නැහැ. ඒ නිසා සමහරු සරත්ගෙ බණ අහනවා. අනික් අතට ඔහු දූෂණ විරෝධීව සාධාරණත්වයේ කොඩිය අතට අරන් ඉන්නවා. කරන්න දෙයක් නැතිකමට මිනිස්සු ඒ පස්සෙ යනවා. ගහගෙන යන එකා පිදුරුගහේ එල්ලෙනවා වගේ. සරත් අද නීතිය ක්‍රියාත්මක වන විධිය ගැන කියන දේවල් හරියට හරි. ඒත් ඔහු ඒක ක්‍රියාත්මක කළ විධිය නින්දිතයි. අත්තනෝමතිකයි. ඔහු අද මේ කියමින් සිටින නීතිය එදා ක්‍රියාත්මක කළා නම් රට සුරපුරයක්. රටේ පොදු ජනයා මෙයා කරපු දේවල් දන්නෙ නැති නිසා අද කියන දේවල් අහලා සරත් හරි හොඳ මිනිහෙක් කියලා හිතනවා. මේක තමයි සමාජය පත් වෙන්න තියන ලොකුම මුළාව. ■